රට තුළ මේ වනවිට තවත් කොවිඩ්-19 රැල්ලක් හමා යන මොහොතේදී, මෙම වසංගතය මර්දනය කිරීම සේම, ආසාදිතයන් සහ ආශ්‍රිතයන් කොන් කිරීමේ ආකල්පයක් ඇතිවීම වැළැක්වීමද වැදගත් බව පැවසිය යුතුම වේ. මන්දයත්, එවැනි කොන් කිරීමේ ආකල්පයක් ඔස්සේ සිදුවන්නේද වසංගතය මර්දනයට බාධා එල්ලවීම බැවිනි.
පසුතලය එසේ වන විට, ඇතැම් පුවත්පත් සිරස්තලයන් කෙතරම් දුරට සදාචාර සම්පන්නද යන්න අපට පාඨකයින් ලෙස නැවත නැවතත් සිතාබැලීමට සිදුවේ. ඊට උදාහරණ ලෙසින් අරුණ පුවත්පතේ (05/20) සඳහන් 'කොරෝනා මව' යන්න සහ දිවයින පුවත්පතේ (05/20) සඳහන් 'කොරෝනා ගැබිණි මව' යන්න දැක්විය හැක.
යම් පුද්ගලයෙකු කොවිඩ්-19 ආසාදිතයෙකු වීම එම පුද්ගලයාගේ වරදක් නොවේ. එසේ වන විට මෙවැනි යෙදුම් කෙතරම් මාධ්‍ය ආචාර ධර්මානුකූලද, කෙතරම් සදාචාර සම්පන්නද යන්න පිළිබඳව මාධ්‍ය වරක්, දෙවරක් නොව තෙවරක්ම සිතා බැලිය යුතුයි.
මෙවැනි යෙදුම් සිරස්තල තුළ පමණක් දක්නට ලැබීමත්, පුවත් අන්තර්ගතයන් තුළ මෙවැනි යෙදුම් දක්නට නොවීමත් පෙන්වා දිය යුතුවේ. සිරස්තල තුළ හැකිතාක් අවම වචන ප්‍රමාණයකින් අර්ථයක් ඉදිරිපත් කිරීම සඳහා මෙසේ කෙටි කළ යෙදුම් යොදාගන්නා බව අපට අවබෝධ කරගත හැක. නමුත්, එවැනි යෙදුමකින් සිදුවන හානිය ඒ ඔස්සේ සාධාරණීකරණය කළ හැකිද? අප ඇසිය යුත්තේ එයයි.
#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Aruna